**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව**

සතිය - 07

ශ්‍රේණිය - 6

විෂය - චිත්‍ර කලාව

සැකසුම - තමාලි පරණගම

මාවනැල්ල අධ්‍යාපන කලාපය

**නිපුණතාවය :-** 3.0 පාරිභාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :-** 3.3 පාරිභාරික භාණ්ඩයක් සැලසුම්කර වර්ණ ගන්වයි.

**ක්‍රියාකාරකම :-** පාරිභාරික භාණ්ඩයක් මූලික හා ද්විතියික වර්ණ භාවිතා කර අලංකාර කරමු.

ඔබ දැනටමත් මූලික වර්ණ හා ද්විතියික වර්ණ මොනවාදැයි දන්නවා ඇති. පහත වර්ණ චක්‍රය දෙස බලන්න.




මූලික වර්ණ - රතු, කහ, නිල්

ද්විතියික වර්ණ - කොළ, දම්, තැඹිලි

ක්‍රියාකාරකම සඳහා පියවර :-

01. මැටි මාධ්‍යයෙන් සකස්කල ඕනෑම හැඩයකින් යුත් මැටි බඳුනක් සපයා ගන්න.

02. මූලික හා ද්විතියික වර්ණයන්ගෙන් ඔබ කැමති වර්ණ කිපයකින් ලැකර් සපයා ගන්න. මෙහිදී ඔබට හැකිනම් මූලික හා ද්විතියික වර්ණ සියල්ලම වුවද භාවිතා කළ හැකිය.

03. වතුර භාජනයක් රැගෙන ලැකර් වතුරට දමන්න. කෝටු කැල්ලකින් වතුරේ ඇති ලැකර් පොඩ්ඩක් කලවම් කරන්න.

04. දැන් ඔබ විසින් සූදානම් කරගත් මැටි භාජනය ලැකර් සහිත වතුර භාජනයේ හෙමින් ගිල්වා ගන්න.

05. මැටි බඳුන හරවමින් වතුර භාජනය තුළ ඇති ලැකර් මැටි බඳුනේ ගෑවෙන්නට සලස්වන්න.

06. දැන් එය ඉවතට රැගෙන වේලීමට තබන්න.

**සැළකිය යුතුයි :- ඔබට මේ ක්‍රමයට අමතරව විවිධ ක්‍රම භාවිතා කර මැටි බඳුන් අලංකාර කරගත හැකිය. එවැනි ක්‍රම අත්හදා බලන්න.**